සියලු හිමිකම් ඇවිරිණි. [All right reserved]

කැලණිය අධ්‍යාපන කලාපය Kelaniya Education Zone කැලණිය අධ්‍යාපන කලාපය Kelaniya Education Zone කැලණිය අධ්‍යාපන කලාපය Kelaniya Education Zone

**කැලණිය අධ්‍යාපන කලාපය**
**Kelaniya Education Zone**

# දෙවන වාර පරීක්ෂණය – 2024
# Second Term Test – 2024

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / Grade } 6 | විෂයය / Subject } ගණිතය Mathematics | කාලය / Time } පැය 02 |

**නම / විභාග අංකය :**.............................................................................

## I පත්‍රය

- 1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- 1 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ. (2 x 20 = 40)

1) රාජ් ගණිතය විෂය සඳහා ලැබූ ලකුණු සංඛ්‍යාව 73 කි. එය ආසන්න 10 ගුණාකාරයට වටයන්න.

2) 10 ට අඩු ප්‍රථමක සංඛ්‍යා සියල්ල ලියා දක්වන්න.

3) "විසි අට බිලියන තුන් මිලියන දෙසිය විසි දහස් තුන්සිය පහළොව" යන්න ඉලක්කමෙන් ලියන්න.

4) A හා B භාජන දෙකෙහිම ඇති මුළු ද්‍රව ප්‍රමාණය සොයන්න.


| A | B |
|---|---|
| $5l\ 250ml$ | $2l\ 450\ ml$ |

5) $\frac{4}{6}$ ට තුල්‍ය වූ භාග දෙකක් ලියන්න.

6) 22:10 යන්න පැය 12 ක්‍රමයට ලියා දක්වන්න.

7) ඔරලෝසුවක වේලාව 3.00 ලෙස සටහන්ව ඇති අවස්ථාවක, මිනිත්තු කටුවත් පැය කටුවත් අතර කෝණය, කුමන වර්ගයට අයත් දැයි ලියන්න.

8) මෙම සංඛ්‍යා රේඛාවේ සලකුණු කර ඇති ආකාරයට අඩුම උෂ්ණත්වය ඇති නගරය හා වැඩිම උෂ්ණත්වය ඇති නගරය ලියා දක්වන්න.





අඩුම උෂ්ණත්වය ඇති නගරය - ........................................................

වැඩිම උෂ්ණත්වය ඇති නගරය - ........................................................

9) රූප සටහනෙහි දක්වා ඇති වාහන, ඒවාට පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට බෙදා වෙන්කර දක්වන්න.

බසය නැව
බෝට්ටුව කාරය
ලොරිය සබ්මැරීනය




10) පැන්සලක මිල රුපියල් 12කි. එම වර්ගයේ පැන්සල් 8 ක මිල කීයද?

11) (a) සමාන හැඩති මුහුණත් 4 ක් ඇති ඝන වස්තුවේ නම ලියන්න.
(b) එහි මුහුණතක හැඩය ලියා දක්වන්න.

12) සුළු කරන්න : $2007 + 789$


13) ඍජුකෝණාස්‍රය දැක්වෙන රූප තෝරා යටින් ඉරක් අඳින්න.



14) 2, 3, 4, 6 යන ඉලක්කම්වලින් එක් ඉලක්කමක් එක් වරක් පමණක් යොදා ගනිමින් ලිවිය හැකි විශාලම ඔත්තේ සංඛ්‍යාව කුමක්ද?

15) $\frac{1}{2}$, $\frac{1}{7}$, $\frac{1}{4}$ යන භාග සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

16) රූපයට අනුව ළමයාට ________________ දිශාවෙන් ගස පිහිටා ඇත.





17) -4 හා 2 අතර ඇති සියලුම නිඛිල සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියා දක්වන්න.

18) සුළු කර අගය සොයන්න. $89.81 - 72.50$

19) සිසු පුටු 6460 ක් පාසල් 20 කට සමසේ බෙදිය යුතුව ඇත. එක පාසලකට ලැබෙන පුටු ගණන සොයන්න.

20) දී ඇති රූපයේ පරිමිතිය සොයන්න.



**II පත්‍රය**

- **ප්‍රශ්න හයකට** පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ
- ගණිතය II පත්‍රයට පිළිතුරු වෙනත් කඩදාසියක ලියා එය I පත්‍රයට අමුණන්න.

1. තිත් සටහන් මගින් නිරූපණය කර ඇති සංඛ්‍යා රටාවක් පහත දැක්වේ.



i. ඉහත නිරූපණය වන සංඛ්‍යා රටාව හඳුන්වන නම කුමක්ද? (ල. 02)

ii. මෙම රටාවේ 5 වෙනි පදයට අදාල තිත් සටහන අඳින්න. (ල. 02)

iii. මෙම රටාවේ 3 වෙනි හා 4 වෙනි සංඛ්‍යා එකතු කිරීමෙන් ලැබෙන්නේ කුමන සමචතුරස්‍ර සංඛ්‍යාවද? (ල. 02)

iv. පහත දී ඇති ප්‍රකාශ ඔබගේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන, එම එක් එක් ප්‍රකාශ නිවැරදි නම් "✓" ලකුණද වැරදි නම් "×" ලකුණද ඉදිරියෙන් යොදන්න. (ල. 04)

a. 14 සංයුත සංඛ්‍යාවකි.

b. 100 සමචතුරශ්‍ර සංඛ්‍යාවකි.

c. 1 ප්‍රථමක සංඛ්‍යාවකි.

d. 2 ත්‍රිකෝණ සංඛ්‍යාවකි.

---

2. a) ශිෂ්‍යයෙකු ගණිතය ප්‍රශ්න පත්‍රයට ලබාගත් ලකුණු ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට 80 ලැබේ. මේ අනුව,

i. ඔහුට ලබාගත හැකි අවම ලකුණු ගණන කීයද? (ල. 01)

ii. ඔහුට ලබා ගත හැකි උපරිම ලකුණු ගණන කීයද? (ල. 01)

b) සුළු කරන්න.

| | | | |
|---|---|---|---|
| i. $480 \times 10$ | (ල. 02) | iii. $56 \times 47$ | (ල. 02) |
| ii. $38000 \div 100$ | (ල. 02) | iv. $2268 \div 7$ | (ල. 02) |

---

3. 1 සිට 25 තෙක් වූ පූර්ණ සංඛ්‍යා අතරින්,

i. 2 න් හා 5 න් යන සංඛ්‍යා දෙකෙන්ම බෙදෙන සංඛ්‍යා 2 ක් ලියන්න. (ල. 02)

ii. විශාලම තුනෙහි ගුණාකාරය කීයද? (ල. 02)

iii. 20 හි සාධක හතරක් ලියා දක්වන්න. (ල. 02)

iv. පහත සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට සකස් කරන්න.

$0.3, 0.5, 0.35, 1.2$ (ල. 02)

v. සුළු කරන්න. $25.56 - 15.83$ (ල. 02)

4. a) පහත වගුව අනුව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

| මිනුම ලබාගත් ද්‍රව්‍යය | මිනුම |
|---|---|
| ගුරු මේසයේ දිග | 1.08 m |
| ළමා මේසයේ දිග | 75 cm |
| පෑනක දිග | 12 cm 2 mm |

i. ගුරු මේසයේ දිග මීටර් හා සෙන්ටිමීටර් වලින් ලියන්න. (ල. 02)

ii. පෑනේ දිග මිලිමීටර් කොපමණද? (ල. 02)

iii. ළමා මේසයට වඩා ගුරුමේසය කොපමණ දිගකින් වැඩිද? (ල. 02)

b) i. පාද සියල්ල දිගින් සමාන චතුරස්‍ර දෙකක් නම් කරන්න. (ල. 02)

ii. ඉන් එකක් ඇඳ දක්වන්න. (ල. 02)

5. i. ප.ව.7.15 - ප.ව.8.45 දක්වා එක්තරා රූපවාහිනී වැඩසටහනක් විකාශය වේ. එම වැඩසටහන විකාශය වූ කාලය කොපමණද ? (ල. 02)

ii. දිලිනි උපන්නේ 2020 ජූලි මස 18 දිනය. ඇගේ උපන්දිනය අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියා දක්වන්න. (ල. 02)

iii. පහත සදහන් එක් එක් කාලය මිනිත්තු වලට පරිවර්තනය කරන්න.

a.තත්පර 300 (ල. 02)

b.පැය 2 (ල. 02)

iv. සුළු කරන්න. (ල. 02)

| පැය | මිනිත්තු |
|---|---|
| 4 | 35 |
| + 2 | 49 |
| | |

6. i. හිස්තැන් සඳහා > හෝ < ලකුණු යොදා සම්පූර්ණ කරන්න. (ල. 02)

a. $\frac{1}{6}$ ______ $\frac{1}{8}$ b. $\frac{5}{4}$ ______ $\frac{5}{8}$

ii. අගය සොයන්න.

a. $\frac{2}{7}+\frac{1}{7}$ (ල. 02)

b. $\frac{5}{11}-\frac{4}{11}$ (ල. 02)

c. $\frac{4}{9}+\frac{1}{18}$ (ල. 02)

d. $\frac{7}{8}-\frac{1}{2}$ (ල. 02)

7. සංඛ්‍යා නිරූපණය කිරීම සඳහා යොදා ගන්නා අංකනය කරන ලද රේඛාවක්, සංඛ්‍යා රේඛාවක් ලෙස හඳුන්වයි.

   i. නිවරදිව අඳින ලද සංඛ්‍යා රේඛාවක ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

   ii. -5 සිට +5 දක්වා සංඛ්‍යා රේඛාවක් ඇඳ එහි $0, -3, 3, -1$ යන ලක්ෂ්‍ය ලකුණු කරන්න. (ල. 04)

   iii. $<$, $=$ හෝ $>$ යන සංකේත යොදා හිස්තැන් පුරවන්න. (ල. 04)

   a) $-7$ ____ $3$


   b) $8$ _____ $0$

   c) $-5$ _____ $5$


   d) $0.2$ _____ $0.20$

---

8. a) පහත කොටු සටහන තුළ දී ඇති දත්ත ඒවායේ යම් පොදු ලක්ෂණයක් අනුව කාණ්ඩ වලට වෙන් කර ඒවාට ගැලපෙන නාමයන්ද ලියන්න. (ල. 07)




b) මෙම රූපසටහනේ දැක්වෙන්නේ එක්තරා ඝනවස්තුවක් සෑදීමට මලිත ඇඳගත් පතරමකි.




i. මෙම පතරම භාවිතයෙන් සෑදිය හැකි ඝනවස්තුව කුමක්ද? (ල. 01)

ii. මලිත සෑදූ මෙම ඝනවස්තුවේ දාරයක දිග කීයද? (ල. 02)

PARCEL NO

# LOL.lk BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සිසුර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**